**ශීර්ෂය 108- තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය**

**------------------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 26 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 25 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**--------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.

- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය හා 38 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

**1.6.1** **මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම**

--------------------------------------------------------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7(VI) ඡේදය ප්‍රකාරව 2019 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයට පියවිය යුතු ශේෂය එදිනට මුදල් පොතේ සඳහන් ශේෂයට සමාන අගයක් නොගන්නා බැවින් එම ශේෂය සැසඳීම සඳහා අක්මුදල් ගැලපීම් ගිණුමක් සකස් කල යුතු වුවත් එසේ සකස් කරන ලද අක්මුදල් ගැලපීම් ගිණුමෙහි පහත පරිදි නිවරදිව ගැලපීම් සිදුකර නොතිබුණි. | | |
| (අ) පරිගණක මුද්‍රිත සටහන් සමඟ ශේෂ පිරික්සුම රු.350,000 කින් නොසැසඳීම අක්මුදල් ගැලපීම් ගිණුමෙහි දක්වා නොතිබුණි. | භාණ්ඩාගාර මුද්‍රිත සමග ශේෂ පිරික්ෂුම නොසැසඳීම අක්මුදල් ගැලපුම් ගිණුමේ දැක්විය යුතුය. | අමාත්‍යාංශයේ පොත්පත් හා භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව වෙනත් දෙපාර්තමේන්තු විසින්ද දරන ලද වියදම රු.109,640 ක් පමණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අක්මුදල් ගැලපුම් ගිණුමේ දැක්විය යුතු අත්තිකාරම් හර හා බැර ශේෂ පිළිවෙලින් රු.1,515 ක් හා රු.1,323,679 ක් වුවද එය පිළිවෙලින් රු.1,934,297 ක් හා රු.3,781,048 ක් ලෙස දක්වා තිබුණි. | මුදලින් හා හරස් සටහන් මඟින් සිදුකරන ලද අත්තිකාරම් ගෙවීම් හා ලැබීම් වල එකතුව අක්මුදල් ගැලපුම් ගිණුමේ දැක්විය යුතුය. | සාමාන්‍යයෙන් අක්මුදල් ගැලපීම, අත්තිකාරම් ගිණුමේ හරස් සටහන් මඟින් සිදු කෙරේ. ඒ අනුව අත්තිකාරම් ගිණුමේ බැර රු.3,781,048 ක් හා අත්තිකාරම් ගිණුමේ හර රු.1,934,297 මඟින් අක්මුදල් ගැලපීම සිදුකරන ලදී. |
| (ඇ) | අක්මුදල් ගැලපුම් ගිණුමේ දක්වා තිබුණු ශේෂය රු.359,583 ක් වුවද භාණ්ඩාගාර මුද්‍රිත සටහන අනුව එම ශේෂය රු.1,021,290 ක් විය. | භාණ්ඩාගාර මුද්‍රිත සටහන අනුව අග්‍රිම ගිණුමේ ශේෂය අක්මුදල් ගිණුමේ ශේෂයට සමාන විය යුතුය. | භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව 2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු.1,021,290 ක් ලෙස දක්වා ඇතත් අමාත්‍යාංශ පොත් පත් අනුව 2019.12.31 දිනට භාණ්ඩාගාරය වෙත පියවන ලද රු.661,707 ක මුදල අඩු කළ පසු අමාත්‍යාංශයේ පොත් පත් අනුව 2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු.359,583ක මුදලක් ලෙස සටහන් කර ඇත. |

## 1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව අත්තිකාරම් ලැබීම් රු.8,280,485 ක් හා ගෙවීම් රු.6,622,352 ක් පිළිවෙලින් රු.7,155,662 ක් හා රු.5,497,529 ක් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා තිබුණි. | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ අත්තිකාරම් ලැබීම් හා අත්තිකාරම් ගෙවීම් භාණ්ඩාගාර මුද්‍රිත සටහන් වලට අනුව අතුළත් කළ යුතුය. | නිවැරදිව ගිණුම් ගත කර ඇති හර හා බැර වටිනාකම් සැලකිල්ලට ගෙන මූල්‍ය ප්‍රකාශයේ අත්තිකාරම් ලැබීම් රු.7,155,622 ක් හා අත්තිකාරම් ගෙවීම් රු.5,497,523 ක් ලෙස නිවැරදිව සටහන් කර ඇත. |
| (ආ) | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ප්‍රධාන ලෙජර් වියදම් යටතේ භාණ්ඩාගාරයට අක්මුදල් ගෙවීම් රු.761,707 ක් දක්වා තිබුණි. | පළකර ඇති චක්‍රලේඛ ප්‍රකාරව තොරතුරු ඉදිරිපත් කළ යුතුය. | එකඟ වේ. අදාළ චක්‍ර ලේඛය ප්‍රකාරව ඉදිරියේදී තොරතුරු නිවැරදිව වාර්තා කිරීමට සටහන් කර ගන්නා ලදී. |

**1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ වෙනත් වැය ශීර්ෂ සඳහා දරන ලද රු.1,559,942 ක වියදම රු.1,035,355 ක් ලෙස සටහන් කර තිබුණි. | වෙනත් වැය ශීර්ෂ සඳහා දරණ ලද වියදම ගණනය කිරීමේදී වෙනත් වැය ශීර්ෂ යටතේ දක්වා ඇති වටිනාකම් වල එකතුව ගතයුතුය. | මෙය වෙනත් දෙපාර්තමේන්තු වෙනුවෙන් කර ලද ගෙවීමක් නොවන අතර, කාර්ය මණ්ඩල විසුරුවා හැරීම හේතුවෙන් ඔවුන්ට අදාල පාරිතෝෂිතයෙන් අමාත්‍යාංශයට ලැබිය යුතු ණය ශේෂ අයකර ගැනීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අවසර මත තබන ලද හරස් සටහනක් පමණි. |
| (ආ) | ඒකාබද්ධ ශේෂ පිරික්ෂුමට අනුව රු.106,377,683 ක් වූ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්, මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ රු.106,727,683 ක් ලෙස දක්වා තිබුණි. | පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් වටිනාකම ඒකාබද්ධ ශේෂ පිරික්සුමට අනුව ගණනය කර දැක්විය යුතුය. | භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් රු.106,727,683 ක් වේ. |
| (ඇ) | ඒකාබද්ධ ශේෂ පිරික්ෂුමට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අත්තිකාරම් අයකර ගැනීම් රු. 6,956,806 ක් හා ගෙවීම් රු.6,620,837 ක් ලෙස දැක්විය යුතු වුවද පිළිවෙලින් එය රු.3,374,614 ක් හා රු.3,563,232 ක් ලෙස දක්වා තිබුණි. | අත්තිකාරම් අයකර ගැනීම් හා ගෙවීම් ගණනය කිරීමේදී හරස් සටහන් මඟින් සිදුකරන ලද වටිනාකම් ද සැලකිල්ලට ගත යුතුය. | අත්තිකාරම් ගිණුම් වල හරස් සටහන් සැලකිල්ලට නොගෙන මුදලින් කරන ලද ගණුදෙනු පමණක් සැලකිල්ලට ගෙන අත්තිකාරම් අය කර ගැනීම් හා අත්තිකාරම් ගෙවීම් ලෙස පිළිවෙලින් රු.3,374,614 ක් හා රු.3,563,232 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් කර ඇත. |

**1.6.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | පද්ධතියේ වෙනස්කම් සිදුකිරීම හා ඒ පිළිබඳ සමාලෝචන සිදු කරන බවට ප්‍රකාශ විගණනයට විශේෂිතව ඉදිරිපත් කර නොමැති නමුත් සිදුකරනු ලබන අභ්‍යන්තර විගණන වාර්තා පිටපත් ද මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරනු ලබන කළමනාකරණ විගණන කමිටු වාර්තා පිටපතක්ද විගණනයට ඉදිරිපත් කෙරේ. ඉහත පනතේ විධිවිධාන වලට අනුකූලව මේ පිළිබඳ විධිමත් ප්‍රකාශ ඉදිරියේදී විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අධි ප්‍රතිපාදන ලබාගැනීම හේතුවෙන් ප්‍රාග්ධන වැය විෂයයන් 02 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.905,998 ක් එනම් සියයට 36 ක සහ සියයට 85 ක ඉතිරිවීම් නිරීක්ෂණය විය. | වැය විෂයයන් සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදී මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ප්‍රාග්ධන ප්‍රතිපාදනවලින් සියයට 15 ක් වියදම් නොකර රඳවාගන්නා ලෙස භාණ්ඩාගාර චක්‍රලේඛ මගින් දැනුම් දී තිබූ අතර ඒ අනුව ප්‍රාග්ධන වියදම්වලින් සියයට 15 ක් වූ අගයකට සමාන වටිනාකම් විගණන විමසුමේ සටහන් වැය විෂයයන්ගේ ඉතිරි කරන ලදි. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2(ඇ) හි විධිවිධානවලට පටහැනිව සමාලෝචිත වර්ෂයේ දී ඉතිරිය ඉක්මවා රු.1,790,929 ක බැරකම්වලට එළඹ තිබුණි. | 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2 (ඇ) අනුව බැරකම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. | එකඟ වේ.<br>ඉදිරි වර්ෂයේදී එවැනි අඩුපාඩු සිදු නොවන ආකාරයට කටයුතු කිරීමට සටහන් කර ගතිමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් ඉලක්ක කර සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් නොකිරීම හේතුවෙන් අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් හතක් ඉටුකර නොතිබුණි. | අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කළ යුතු ප්‍රධාන කාර්යයන් ඉලක්ක කර ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතුය. | 2019 වර්ෂයේ අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම, අමාත්‍යාංශයට වෙන්කළ සීමිත ප්‍රතිපාදන පදනම් කරගෙන සකස් කරන ලදි. ඡේදයෙන් පෙන්වා ඇති කරුණු සම්බන්ධයෙන් රැස්වීම් වලදි සාකච්ඡා කර අවශ්‍ය පරිදි ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් උපදෙස් ලබාදෙන ලදී. |

### 3.2 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රක්ෂණයෙන් ආවරණය නොවූ වාහන අනතුරු 04 ක අලාභය රු.478,579 ක් වූ අතර එම අලාභ වගකිව යුතු පුද්ගලයින්ගෙන් අයකර ගෙන නොතිබුණි. | වගකිව යුතු පාර්ශවයන්ගෙන් අලාභය අයකර ගත යුතුය. | අලාභය අයකරගැනීමට කටයුතු කරමින් සිටින බව. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දිළිදුකම පිටුදැකීමේ වැඩසටහනට සමගාමීව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට (SME) දේශිය හා ජාත්‍යන්තර වෙළඳපොල හඳුන්වාදීමේ අරමුණින් bepost.LK ඊ- ව්‍යාපර සංවර්ධන වැඩසටහන හඳුනාගෙන තිබුණද ප්‍රතිපාදන නොමැතිවීම හා තැපැල් ජාල මෘදුකාංග පද්ධතියේ දුර්වලතා නිසා වැඩසටහන ආරම්භයේදී හඳුනාගන්නා ලද ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය. | පවතින ගැටළුවලට පිළියම් යොදා තිරසර සංවර්ධන ඉලක්ක ලබාගත යුතුය. | ආරම්භයේදී හඳුනාගත් ඉලක්ක සපුරා ගැනීමේ මට්ටමට වැඩසටහන ක්‍රියාත්මක වී නැති අතර මෘදුකාංග පද්ධතියේ මන්දගාමී බව සහ වරින් වර සිදුවූ බිඳිවැටීම් නිසා ප්‍රමාණවත් ප්‍රතිලාභීන් පිරිසක් මේ සඳහා සම්බන්ධ කර ගැනීමට හැකි වී නැත.අවශ්‍ය පරිදි මෘදුකාංග පද්ධතිය වැඩිදියුණු කිරීමට සහ වැඩසටහන සඳහා ප්‍රචාරණ කටයුතු කිරීමට, අදාල වර්ෂය තුළ ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම නිසා අදාල ඉලක්ක සපුරාගනිමින් වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. |